**බස්නාහිර පළාත් සභාව - 2015**

---

බස්නාහිර පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2016 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

### 2.2.2 අනෙකුත් ගිණුම්

2016 ජූලි 15 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | 2015 වර්ෂයට අදාලව | | |
|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i). | විසර්ජන ගිණුම් | 27 | 27 | - |
| (ii). | ආදායම් ගිණුම් | 30 | 30 | - |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 27 | 27 | - |
| (iv). | වානිජ අත්තිකාරම් ගිණුම් | 02 | 01 | 01 |
| (v). | වෙනත් අත්තිකාරම් ගිණුම් | 06 | 06 | - |
| (vi). | අරමුදල් ගිණුම් | 05 | 05 | - |
| (vii). | ප්‍රඥප්ති ගිණුම් | 09 | 04 | 05 |
| | එකතුව | 106 | 100 | 06 |

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ස්ථාවර වත්කම් හා හිඟ ආදායම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. එහෙත් වියදම් ශීර්ෂ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,899,489,138 ක ස්ථාවර වත්කම්ද ආදායම් ශීර්ෂ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.8,276,882,994 ක හිඟ ආදායමක්ද පැවතුණි.

### 2.2.4 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 05 ක වැය විෂයයන් 12 ක් වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ රු.5,624,100 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ආ) ශුද්ධ ප්‍රතිපාදනය යටතේ වැය ශීර්ෂ 05 ක අවස්ථා 24 කට අදාලව රු.219,372,884 ක් ලෙස සියයට 50 ට වඩා වැඩි ප්‍රතිශතයන් ඉතිරිව පැවතුණි.

(ඇ) මුදල්, මුද්දර නැතිවීම් ගිණුම්ගත කිරීමේ අත්තිකාරම් ගිණුම - විෂයය අංක - 10903 යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව රු.මිලියන 03 ක උපරිම වියදම් සීමාවක් හා රු.මිලියන 04 ක උපරිම හර ශේෂ සීමාවන් පනවාගෙන පැවතියද වර්ෂය තුළ එයින් අත්තිකාරම් ලබාදීමේ අවශ්‍යතාවයක් ඇතිවී නොතිබුණි. මේ යටතේ 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම්

කාර්යාලයට ලබාදී තිබූ රු.915,786 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල්ව නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා යතුරුපැදි ණය ලබාදීම - විෂයය අංක - 10904 සඳහා වූ අත්තිකාරම් ගිණුම - 2013 වර්ෂයේ ආරම්භ කර එදින සිට උපරිම වියදම් සීමාව යටතේ එකතු වටිනාකම රු.2,850,000 ක් නියමකර පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එයින් ණය ලබාදීමක් සිදුව නොතිබුණි.

**2.2.5 නොසැසඳීම්**

-------------

පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාල පොදු තැන්පතු ශේෂය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තු පොත් අනුව හා පළාත් භාණ්ඩාගාර පොත් අනුව වූ ශේෂයන් අතර රු.6,122,459 ක නොසැසඳීම් පැවතුණි.

**2.2.6 අග්‍රිම**

------

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ආයතන 10 කට අදාලව නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු.410,812,351 ක්වූ අතර එය ආයතන 07 කට අදාලව හර එකතුව රු.409,487,380 කින් හා ආයතන 03 කට අදාලව බැර එකතුව රු.1,324,971 කින් සමන්විත විය.

**2.2.7 ප්‍රේෂණ**

--------

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ආයතන 08 කට අදාලව නිරවුල් නොකළ ප්‍රේෂණ ශේෂ එකතුව රු.59,156,435 ක්වූ අතර එය ආයතන 06 කට අදාලව හර එකතුව රු.58,921,935 කින් හා ආයතන 02 කට අදාලව බැර එකතුව රු.234,500 කින් සමන්විත විය.

**2.2.8 අත්තිකාරම් ගිණුම්**

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම - විෂයය අංක - 12002 උපරිම හර ශේෂ සීමාව රු.2,290,000 ක් වූවත් පළාත් භාණ්ඩාගාර පොත් අනුව එම අගය රු.7,089,274 ක බැර ශේෂයක් විය.

(ආ) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 25 ක හා මන්ත්‍රීවරුන්ට අත්තිකාරම් ගිණුම් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.267,807,061 ක් විය. එයින් වසරකට වැඩි කාලයක සිට අයනොවී පවතින ශේෂවල එකතුව පිළිවෙලින් රු.188,944,846 ක් හා රු.41,113 ක් විය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාල සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල සිට පැවත එන නිරවුල් නොකළ පළාත් සභා නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ශේෂවල එකතුව රු.303,954 ක් විය.

**2.2.9 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයේ ගුරුවරුන්ගෙන් හා නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අයවිය යුතු වැටුප් රහිත නිවාඩුවල වටිනාකම රු.864,837 ක් විය.

(ආ) කොළඹ කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයේ පාසැල්වල 2014 දෙසැම්බර් 31 දිනට වියදම් නොකර පැවති ගුණාත්මක යෙදවුම් මුදල් රු.8,364,199 ක් 2015 වර්ෂයේදී පාසැල්වලින් ලබාගෙන කලාප කාර්යාලවල පොදු තැන්පතු වශයෙන් ගිණුම්ගත කර තිබුණි. 2015 දෙසැම්බර් 31 වනවිට එයින් රු.5,160,980 ක් පමණක් වැයකර තිබුණි.

(ඇ) ආයතන 06 කට අදාලව තැන්පත් කර වර්ෂ 02 ඉක්මවූ නිරවුල් නොකළ තැන්පතුවල වටිනාකම රු.13,946,066 ක් විය.

**2.2.10 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

පහත කරුණුවලට අදාලව ප්‍රමාණවත් සාක්ෂි / තොරතුරු ඉදිරිපත් නොවුණි.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කොළඹ කලාප අධ්‍යාපන කාර්යලය විසින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මිලදීගෙන තිබූ රු.3,045,325 ක භාණ්ඩ හා කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් උපමාන පාදක ප්‍රදාන යටතේ මිලදීගෙන තිබූ රු.2,162,172 ක භාණ්ඩවලට අදාල භාණ්ඩ ලැබීමේ නිවේදන (GRN) හා භාණ්ඩ නිකුත් කිරීමේ නිවේදන (GIN) විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ආ) 2016 ජුනි 30 දිනට ආයතන 07 කට අදාල විගණන විමසුම් 48 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.11 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---

පහත නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) බස්නාහිර පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය 2008

---

(i) පළාත් මූල්‍ය රීති 157(2) ප්‍රකාරව වවුචරයක අදාල මුදල ඉලක්කමෙන් මෙන්ම අකුරෙන්ද සඳහන් කළයුතු වුවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගෙවීම් වවුචර් 1,000 ක පමණ මුදල අකුරෙන් සඳහන් කර නොතිබුණි.

(ii) පළාත් මූල්‍ය රීති 169(1) හා 177 ප්‍රකාරව සහතික කරන නිලධාරියා විසින් සියළුම වවුචර් පත් සහතික කළයුතු වුවත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශයේ රු.4,393,947 ක් වටිනා වවුචර් 06 ක් සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි.

(iii) පළාත් මූල්‍ය රීති 476 ප්‍රකාරව 2014 හා 2015 වර්ෂයන් සඳහා කොළඹ කලාප අධ්‍යාපන කාර්යලයේ භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

(ආ) 2013 නොවැම්බර් 28 දිනැති අංක 7/2013 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය

---

කළුතර අධ්‍යාපන කලාපයට අයත් ඥානෝදය විදුහලේ පාසැල් සංවර්ධන සමිති මුදල් පොත් අනුව 2015 වර්ෂය අවසානයට රු.3,270,188 ක මුදල් ශේෂයක් පැවතුණි. මීට අමතරව බ.ප./ගම්/බණ්ඩාරවත්ත පරාක්‍රම මහා විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිති ගිණුමේ මාසිකව රු.3,690,207 ක හා රු.6,783,750 ක පරාසයක මුදලක් අත රඳෙමින් පැවතුණි. මෙම මුදල් උක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තිය

------------------------------------------------

(i) ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පවත්වාගෙන යනු ලබන සියළු පෙර පාසැල් ලියාපදිංචි කිරීමටත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතුව තිබුණි. 2015 නොවැම්බර් මාසය වනවිට බස්නාහිර පළාතේ එලෙස ලියාපදිංචි නොවූ පෙර පාසැල් ප්‍රමාණය 381 ක් බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ii) ප්‍රඥප්තියේ III කොටස 6 වගන්තියේ විධිවිධාන අනුව අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පෙර පාසැල් උපදේශන කමිටුවක් පත්කළ යුතු වුවද 2016 ජනවාරි 28 විගණන අවස්ථාව වනවිටත් එවැනි කමිටුවක් පත්කර නොතිබුණි.

(iii) ප්‍රඥප්තියේ IV කොටස 11 වගන්තියේ විධිවිධාන අනුව පෙර පාසැල් සංවර්ධන අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටුවිය යුතු වුවත් 2016 ජනවාරි 28 විගණන අවස්ථාව වනවිටත් එවැනි අරමුදලක් පිහිටුවා නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 05 දිනැති අංක 35/2014(1) දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය

------------------------------------------------------------------------------------------

චක්‍රලේඛයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ගුරුවරුන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහනය කිරීම 2015 අගෝස්තු 31 වනවිට අවසන් කළ යුතුව තිබූ නමුත් කොළඹ අධ්‍යාපන කලාපයේ සමාලෝචිත වර්ෂය අවසන් වනවිට තවදුරටත් අන්තර්ග්‍රහනය කරගත යුතු ගුරුභවතුන් සංඛ්‍යාව 523 ක් විය.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006

-------------------------------------------------------

5:4:12 විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වෙත වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දියයුතු විය. නමුත් ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල විසින් ගෙවීම් කරන ලද වැට් බදුවලට අදාලව එම තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.12 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

**-------------------------------------------------------**

පෞද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව විසින් පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අළුත් කිරීම වෙනුවෙන් අයකළ ගාස්තු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ප්‍රේෂණය කිරීමේදී වෛද්‍යවරයෙකුගේ වැටුප ලෙස එම මුදලින් රු.480,000 ක් අඩු කර තිබුණි. පළාත් සභාවට අයවිය යුතු ආදායමින් සෘජුවම වියදම් දැරීම සඳහා වූ පළාත් සභාවේ හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ඉදිරිපත් නොවුණි.

**3. ආදායම් කළමනාකරණය**

**---------------------------**

**3.1 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම**

**---------------------------------------------**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 කට අදාලව පළාත් සභාවේ ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම පහත පරිදි විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම | | තථ්‍ය ආදායම | |
|---|---|---|---|---|
| | බදු ආදායම | බදු නොවන ආදායම | බදු ආදායම | බදු නොවන ආදායම |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2011 | 19,952,560 | 1,855,488 | 21,669,946 | 2,847,473 |
| 2012 | 23,046,025 | 2,832,661 | 22,156,277 | 3,947,232 |
| 2013 | 27,302,025 | 2,815,230 | 22,262,325 | 3,259,241 |
| 2014 | 28,284,973 | 2,992,291 | 28,112,653 | 2,979,182 |
| 2015 | 33,130,020 | 2,760,154 | 31,540,490 | 3,268,552 |

**3.2 ආදායම් ශීර්ෂ අංක 20-02-01-03 පළාත් ඉඩම් කොමසාරිස්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 02 රූඩ් 01 පර්චර්ස් 10 ක ඉඩමක් අවුරුදු 30 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයක් වෙත බදුදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වනවිට හිඟ බදු මුදල රු.254,100 ක් විය.

(ආ) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නුගේගොඩ හයිලෙවල් පාරේ පිහිටි ඉඩමක් 2000 වර්ෂයේදී වසර 30 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු ඔප්පුවක් මත බදුදී තිබුණි. අදාල බදු ගිවිසුම අනුව වසර 05 කට වරක් දීමනාකරු විසින් සියයට 50 ට නොඅඩු මුදලකට බදු මුදල තක්සේරු කර බදු අයකර ගත යුතුව පැවතුණි. ඒ අනුව 2005 හා 2010 වර්ෂවලදී බදු සංශෝධනයක් සිදුකර නොතිබූ අතරම 2015 ඔක්තෝබර් 30 වනවිට හිඟ බදු මුදල රු.1,342,234 ක් විය.

(ඇ) ජාඇල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් කොටස් 24 ක් 2000 වර්ෂයේ සිට පුද්ගලයින් 23 දෙනෙකුට දිගුකාලීන බදු පදනම මත ලබාදීමට අනුමතවී තිබුණි. 2016 අප්‍රේල් මාසය වනවිටත් එයින් 17 දෙනෙකුගේ ඉඩම්වල රජයේ තක්සේරුව ලබාගෙන බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. තක්සේරු කර තිබූ ඉතිරි ඉඩම් කොටස් 07 ට අදාලව 2016 අප්‍රේල් මාසයේ විගණන අවස්ථාව වනවිට රු.3,483,000 ක හිඟ බදු මුදලක් පැවතුණි.

(ඈ) ජාඇල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජාඇල වත්ත ජනපදයේ මූ.පි.කො. 509 පිඹුරේ කැබලි අංක 09 සඳහා බදු ගණනය කිරීමේදී වාර්ෂික බදු වටිනාකම රු.7,000 ක් අඩුවෙන් ගණනය කිරීම නිසා රු.210,000 ක බදු මුදලක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ඉ) ජාඇල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රාගම තලගොල්ල ගමේ පිහිටි හෙක්ටයාර් 4.209 ක් විශාල වූ ඉඩම 1981 වර්ෂයේදී බදු ගිවිසුමක් මඟින් උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයට අවුරුදු 30 කට බදුදී තිබුණි. මෙම වෛද්‍ය විද්‍යාලය කැළණිය විශ්ව විද්‍යාලයට පවරා ගැනීමෙන් අනතුරුව එම ඉඩම් කොටස කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා යොදාගෙන තිබුණි. වසර 30 ක්වූ බදු ගිවිසුම් කාලය 2011 මැයි මාසයේ අවසන්වී තිබුණද නැවත එය දීර්ඝ කිරීමට කටයුතු නොකිරීමෙන් වර්ෂ 04 1/2 ක බදු ආදායම් නියමිත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) ජාඇල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 'රාගම ප්‍රීතිපුර ළමා නිවාසය' පිහිටි රජයේ ඉඩමෙන් පර්චස් 156 ක කොටසක් දීර්ඝකාලීන බදු පදනම මත 2008 වර්ෂයේ සිට කොළඹ උතුරු නගර ජල සම්පාදන ව්‍යාපෘතියට ලබාදී තිබුණි. එහෙත් මීට අදාල බදු මුදල් තක්සේරු කර බදු අයකිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

(උ) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පර්චස් 80 ක ඉඩමක් පෞද්ගලික සමාගමක් වෙත වර්ෂ 50 කට බදු දීමට තීරණය කර 2007 වර්ෂයේදී අදාල සමාගමට පවරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බදු දීමේ කටයුතු අවසන් කර නොතිබීම

හේතුවෙන් භුක්තිය පැවරූ දින සිට අයකරගත හැකිව තිබූ රු.3,200,000 ක පමණ බදු මුදලක් පළාත් සභාවට අහිමිවී තිබුණි.

(ඌ) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පර්චස් 49.5 ක ඉඩමක් පෞද්ගලික සමාගමක් වෙත වර්ෂ 30 කට බදු දීමට තීරණය කර 2007 වර්ෂයේදී අදාල සමාගමට පවරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බදු දීමේ කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් භුක්තිය පැවරූ දින සිට අයකරගත හැකිව තිබූ රු.2,495,000 ක පමණ බදු මුදලක් පළාත් සභාවට අහිමිවී තිබුණි.

(එ) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 0.1091 ක ඉඩමක් ජාත්‍යන්තර සිංහ සමාජයට බදු දීමට තීරණය කර 2007 වර්ෂයේදී පවරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බදු දීමේ කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් භුක්තිය පැවරූ දින සිට අයකරගත හැකිව තිබූ රු.4,840,000 ක පමණ බදු මුදලක් පළාත් සභාවට අහිමිවී තිබුණි.

(ඒ) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පර්චස් 80 ක ඉඩමක් පෞද්ගලික සමාගමක් වෙත වර්ෂ 50 කට බදු දීමට තීරණය කර 2007 වර්ෂයේදී අදාල සමාගමට පවරා තිබුණි. සමාගම විසින් එකී ව්‍යාපාර කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආරම්භ කර නොතිබූ හෙයින් පළාත් සභාවට අයකරගත හැකිව තිබූ බදු මුදල් අයකර ගත නොහැකිවී තිබුණි.

(ඔ) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 0.2178 ක ඉඩමක් සමූපාකාර සමිතියකට රෝහලක් ඉදිකිරීම සඳහා බදු දීමට තීරණය කර 2007 වර්ෂයේදී අදාල සමිතියට වෙන් කර තිබුණි. සමිතිය විසින් අදාල රෝහල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආරම්භ කර නොතිබූ හෙයින් පළාත් සභාවට අයකරගත හැකිව තිබූ බදු මුදල් අයකර ගත නොහැකිවී තිබුණි.

(ඕ) රජයේ ඉඩම් වාර්ෂික බලපත්‍ර මත බදුදීම මත වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බදුකරුවන් 51 දෙනෙකුගෙන් අයකර ගතයුතු හිඟ බදු මුදල රු.435,049 ක් විය.

(ක) මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දීර්ඝකාලීනව බදුදුන් ඉඩම් වෙනුවෙන් ආයතන 03 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු බදු මුදල රු.1,314,500 ක් විය.

## 3.3 ආදායම් ශීර්ෂ අංක 10-02-04-05 පළාත් ආදායම් කොමසාරිස්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 පෙබරවාරි 13 දිනැති අංක 973 දරන නිවේදනය අනුව වත්තල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ආයතන 04 ක් වෙනුවෙන් අයකළ යුතු රු.750,000 ක්වූ සුරාබදු බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ආ) 2009 අගෝස්තු 25 දිනැති අංක EC/G/R/L/2009 දරන සුරාබදු කොමසාරිස්ගේ චක්‍රලේඛය පරිදි ගම්පහ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ආයතනයකින් අයකළ යුතු රු.300,000 ක්වූ බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඇ) අංක 0901/19 දරන 2015 පෙබරවාරි 13 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පලකර තිබූ සුරාබදු නිවේදන 974 අනුව 2015 වර්ෂයට නියමිත සංශෝධිත බලපත්‍ර ගාස්තුව 2015 මාර්තු 31 දිනට පෙර ගෙවා අවසන් කළයුතු විය. එහෙත් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අදාලව ආයතන 09 කින් අයවිය යුතු රු.1,086,665 ක්ද හෝමාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ආයතන 03 කින් අයවිය යුතු රු.586,000 ක්වූ සුරාබදු බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. එමෙන්ම කැස්බෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අදාල ආයතන 02 ක හා මොරටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අදාල ආයතන 02 ක සුරාබදු බලපත්‍ර ගාස්තු හිඟ මුදල් ගණනය කර නොතිබුණි.

**3.4 ආදායම් ශීර්ෂ අංක 10-03-07-01 පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**

2006 අංක 21 දරන පෞද්ගලික සාත්තු නිවාස ලියාපදිංචි කිරීමේ පනතේ හා 2007 මාර්තු 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති පරිදි පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් සියයට 50 ක් පළාත් සභාවේ මෙම ආදායම් ශීර්ෂයට ලැබිය යුතුව තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් සභාවට එම ආදායම රු.2,131,750 ක් අඩුවෙන් ලැබී තිබූ බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

**04. මූල්‍ය සමාලෝචනය**

**4.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත පරිදි පළාත් සභා අරමුදලේ රු.1,846,284,700 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.47,191,903 ක් විය.

| | 2015 | 2014 | විචලනය |
|---|---|---|---|
| **ආදායම්** | රු. | රු. | රු. |
| බදු | 31,540,489,688 | 28,112,652,917 | 3,427,836,771 |
| බදු නොවන | 3,268,551,781 | 2,979,181,771 | 289,370,010 |
| **රජයේ ප්‍රදාන - පුනරාවර්තන** | 18,842,196,000 | 11,699,313,000 | 7,142,883,000 |
| **ප්‍රාග්ධන** | 2,912,561,610 | 1,607,184,120 | 1,305,377,490 |
| **එකතුව** | 56,563,799,079 | 44,398,331,808 | 12,165,467,271 |
| **වියදම්** | | | |
| **පෞද්ගලික පඩිනඩි** | 32,301,076,443 | 25,119,406,935 | 7,181,669,508 |
| **අනෙකුත් පුනරාවර්තන** | 17,132,714,424 | 13,462,640,733 | 3,670,073,691 |
| **ප්‍රාග්ධන (පළාත් ආයෝජන)** | 5,283,723,512 | 5,863,476,043 | (579,752,531) |
| **එකතුව** | 54,717,514,379 | 44,445,523,711 | 10,271,990,668 |
| **අතිරික්තය / හිඟය** | **1,846,284,700** | **(47,191,903)** | **1,893,476,603** |

**4.2 ව්‍යුහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව අතිරික්තය රු.1,893,476,603 කින් වැඩිවීම සඳහා රජයේ ප්‍රදාන රු.8,448,260,490 ක වැඩිවීම හා පළාත් ආයෝජන රු.579,752,531 කින් අඩුවීම ප්‍රධාන ලෙස බලපා තිබුණි.

(ආ) පළාත් සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල මුළු ආදායම වූ රු.56,563,799,079 න් සියයට 61 ක් එනම් රු.34,809,041,469 ක් සභාවේ උත්පාදිත ආදායම් වන අතර සියයට 39 ක් එනම් රු.21,754,757,610 ක් රජයේ ප්‍රදානවලින් සමන්විත විය.

(ඈ) පළාත් සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල මුළු වියදම වූ රු.54,717,514,379 න් සියයට 90 ක් එනම් රු.49,433,790,867 ක් පුනරාවර්ථන වියදම් වූ අතර සියයට 10 ක් එනම් රු.5,283,723,512 ක් ප්‍රාග්ධන වියදම්වලින් සමන්විත විය.

(ඇ) රජයේ ප්‍රදාන යටතේ පසුගිය වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන සියයට 38 ක් එනම් රු. 7,142,883,000 කින්ද ප්‍රාග්ධන ප්‍රදාන සියයට 49 ක් එනම් රු.1,305,377,490 කින්ද වැඩිවී තිබුණි.

(ඉ) වියදම් යටතේ පසුගිය වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 22 ක් එනම් රු.10,851,743,199 කින් වැඩිවී තිබූ අතර ප්‍රාග්ධන වියදම (පළාත් ආයෝජන) සියයට 11 ක් එනම් රු.579,752,531 කින් අඩුවී තිබුණි.

### 4.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
---------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ජංගම ගිණුම් දෙකක රු.749,465,748 ක ශේෂයක් සහ කෙටිකාලීන ආයෝජන යටතේ රු.7,250,000,000 ක ශේෂයක් පැවතුණි.

## 5. අධිකාරී ගිණුම් හා අරමුදල් ගිණුම්
---------------------------------------

### 5.1 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය
---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවාගැනීමේ පරිපාටිය අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමඟ විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු බවට සඳහන්වී තිබුණි. මෙකී තනතුරට 2011 ජූලි 01 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරියා 2014 මැයි 02 දින සිට එම තනතුරේ ස්ථිර කර තිබූ නමුත් ඔහු විසින් තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරාගෙන ඇති බවට විගණනයේදී තහවුරු නොවුණි.

(ආ) ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය විසින් සැලසුම් කර තිබූ බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධනය පිළිබඳ සාකච්ඡාවක් 2014 ඔක්තෝබර් 07 දින සිට 20 දින තෙක් රු.7,347,866 ක වියදමක් දරා ඕස්ට්‍රේලියාවේදී පවත්වා තිබුණි. සාමාජිකයන් 07 දෙනෙකු සහභාගිවී තිබූ මෙකී සංචාරය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරිණියද එවකට ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්වරයාද සහභාගී වී තිබූ අතර ඒ දෙදෙනා සඳහා රු.1,800,000 කට ආසන්න මුදලක් දරා තිබුණි. මෙකී සංචාරයෙන් පළාතේ සංවර්ධනයට වූ දායකත්වය සහ අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරිණිය සහභාගී කරවීමේ අවශ්‍යතාවය පිළිබඳ පිළිගත හැකි තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) බස්නාහිර පළාතේ ආගමික ස්ථානවල පවත්වාගෙන යන දහම් පාසල් සඳහා සනීපාරක්ෂක හා පොදු පහසුකම් සැලසීමේ ව්‍යාපෘතියක් ලෙස 'සරුදම් අරුණැල්ල' ව්‍යාපෘතිය ක්‍රියාත්මකවී තිබූ අතර ව්‍යාපෘතියේ II වන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා රු.261,114,300 ක මුදලක් ප්‍රධාන ලේකම්වරයාගේ වැය ශීර්ෂය යටතේ අධිකාරියට ලැබී තිබුණි. ව්‍යාපෘතියේ මූලික අරමුණට පටහැනිව ප්‍රචාරන හා සංග්‍රහ කටයුතු සඳහා රු.16,843,574 ක වියදමක් දරා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 5.2 කර්මාන්ත සංවර්ධන අධිකාරිය
-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 'පුද්ගල නිපුණතා සංවර්ධන නිපුණතා' ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ කොටසක අනවසර පෙර පාසලක් පවත්වාගෙන යමින් පැවතුණි.

(ආ) අධිකාරිය යටතේ ක්‍රියාත්මක 'පිළියන්දල' දැල්තර දැව භාණ්ඩ නිමාව සකස් කිරීමේ ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කර ඉදිකිරීම් හා උපකරණ සඳහා රු.2,578,203 ක් පමණ වැයකර තිබූ නමුත් මෙම ව්‍යාපෘතියේ අරමුණ වූ අඩු ආදායම්ලාභී දැව කර්මාන්ත කරුවන්ගේ දැව නිෂ්පාදනවල නිමාව සකස් කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස මෙය භාවිතා කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් සිදුවී නොතිබුණි.

**5.3 සංචාරක මණ්ඩලය**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංචාරක මණ්ඩලය විසින් මීගමුව ඒත්තුකාල වෙරළ උද්‍යානය ඉදිකිරීම 2010 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.165,921,430 ක වියදමක් දරා තිබුණි. මෙම උද්‍යානය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවාගෙන නොතිබුණි.

(ආ) පාප් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණීම හේතු කොටගෙන 2015 වර්ෂයේ සංචාරක මණ්ඩලය විසින් ටී ෂර්ට්ස් 200 ක් රු.170,000 කට මිලටගෙන තිබුණු අතර ඒවා තොග ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. එසේම බෙදාහරින ලද ආකාරය පිළිබඳ විස්තර කිසිවක් හෝ ලබාගෙන තිබුණු අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පවතින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වනු ලබන නිල්කොඩි දිනය වෙනුවෙන් එම අධිකාරියේ ඉල්ලීමකට අනුව සංචාරක මණ්ඩලය විසින් හිස්වැසුම් 1,000 ක් රු.240,000 කට මිලටගෙන එම අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ සඳහා ලබාගත් අනුමැතියක් හෝ අවශ්‍යතාවය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

**5.4 සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය**

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ නර්තන හැකියාවන් ඇති ආධුනිකයන්ගේ කුසලතාවයන් ප්‍රවර්ධනය කිරීමේ හය මාසික පුහුණු පාඨමාලාව සඳහා සිසුන් 75 ක් පුහුණු කිරීමට රු.576,400 ක් වෙන්කර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය අනුමතවීම 2015 ජූලි 20 දක්වා ප්‍රමාදවීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) අධිකාරියේ තැන්පත් ගිණුමේ වර්ෂ 02 ක් ඉකුත්ව තිබූ නිරවුල් නොකළ තැන්පතුවල වටිනාකම රු.1,117,100 ක් විය.

(ඇ) අධිකාරි පරිශ්‍රයේ පිහිටි පොකුණු 02 ක් පිරිසිදු කිරීම සඳහා 2012 වර්ෂයේදී රු.545,000 ක් වටිනා උපකරණ සවිකර තිබූ නමුත් මෙම උපකරණ අක්‍රියවී තිබීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට පොකුණු පිරිසිදු කිරීමේ කටයුතු සිදුවී නොතිබුණි.

**5.5 අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2014 වර්ෂයේදී දේශීය ආදායම් කොමසාරිස් වෙත එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමේදී රු.356,000 ක වැඩිපුර ගෙවීමක් සිදුවී තිබූ නමුත් එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියේ අරමුණුවලට අදාල නොවන කාර්යයන් සඳහා 2014 වර්ෂයේ අවස්ථා 02 කදී රු.291,350 ක් වැයකර තිබූ අතර ඒ සඳහා ලබාගත් අනුමැතියක්ද ඉදිරිපත් නොවුණි.

(ඇ) අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත ලබාදී තිබූ වාහන නීත්‍යානුකූලව පවරාදී නොතිබීම නිසා එම වාහන රක්ෂණය කිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී අධිකාරියේ අරමුදලින් රු.1,364,806 ක් වැයකර තිබුණි.

(ඇ) අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කරදියාන 'අපද්‍රව්‍ය මගින් විදුලිජනන ව්‍යාපෘතිය' සඳහා පවරාගත් ඉඩමට වන්දි මුදල් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් 2014 වර්ෂයේදී රු.796,493 ක පොලී මුදලක් ගෙවීමට සිදුව තිබුණි. 2011 වර්ෂයේදී පවරාගෙන තිබූ මෙම ඉඩමේ අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කඩුවෙල කොරතොට 'මයික්වත්ත' නැමති ඉඩම 'අපද්‍රව්‍ය මගින් විදුලිය නිපදවීමේ' ව්‍යාපෘතියක් සඳහා 2012 වර්ෂයේදී අධිකාරිය වෙත පවරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර 2014 වර්ෂයේදී පමණක් මෙකී ඉඩමේ ජල, විදුලි හා ආරක්ෂක වියදම් වශයෙන් රු.1,371,475 ක් වැයකර තිබුණි.

## 5.6 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

.

(අ) රජයේ ආයතනවල වාහන අළුත්වැඩියා කිරීම නිසා අයකර ගතයුතු ගාස්තු වශයෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණු රු.2,135,454 ක් හා වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට අයකර ගතයුතු රු.2,743,150 ක්ද විය. එමෙන්ම වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණු යන්ත්‍ර කුලී ගාස්තුව රු.31,954,883 ක් විය.

(ආ) අධිකාරිය විසින් 2011 වර්ෂයේදී හා 2013 වර්ෂයේදී මිලදී ගත් වාහන 14 ක් සඳහා 2011 අංක 15 සහ 2012 අංක 12 දරන මුදල් පනත් ප්‍රකාරව ගෙවිය යුතු ද්විත්ව කාර්ය අර්ධ සුඛෝපභෝගී බදු රු.414,000 ක් ගෙවා නොතිබුණි.

(ඇ) පළාත් මූල්‍ය රීති 261 ප්‍රකාරව ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු නමුත් 2011,2012 සහ 2013 වර්ෂවල අවස්ථා 20 කදී ලබාදුන් රු.10,352,345 ක අග්‍රිම විගණන අවස්ථාව වූ 2015 අගෝස්තු මාසය දක්වාත් පියවා නොතිබුණි. එමෙන්ම අධිකාරියේ අරමුණුවලට අදාල නොවන කාර්යයන් සඳහා අවස්ථා 06 කදී රු.3,729,638 ක් අධිකාරියේ අරමුදලින් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

(ඈ) 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව කුලී පදනම මත ලබාගන්නා වාහන සඳහා ගෙවිය හැකි වැට් බදු රහිත මාසික උපරිම කුලිය රු.40,000 ක් විය. එසේ වුවත් අධිකාරිය විසින් මාසික කුලිය රු.50,000 සිට රු.100,000 දක්වා ලබාගත් වාහන 18 ක් වෙනුවෙන් 2013 වර්ෂයේදී රු.2,210,000 ක් වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

(ඉ) අධිකාරියට අයත් අනතුරට පත්වී තිබූ අංක WP/PA - 1694 දරන වාහනය විධිමත් මිල ගණන් කැඳවීමකින් තොරව රු.572,625 ක ඇස්තමේන්තුවක් මත 2013 ජූලි 03 දින අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. 2016 ජූලි මාසයේ විගණන අවස්ථාව දක්වාම මෙම වාහනය අළුත්වැඩියා කර අධිකාරියට භාරදී නොතිබූ නමුත් අනතුර වෙනුවෙන් රක්ෂණ වන්දි ලෙස ලැබුණ රු.331,290 ක මුදල 2013 ජූනි මාසයේදී එම ආයතනයට ලබාදී තිබුණි.

(ඊ) අධිකාරිය විසින් රු.158,030,625 ක් වැය කර 2012 වර්ෂයේදී මිලදීගත් කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර දෙකක් කිසිදු මාර්ග ඉදිකිරීමක් සඳහා යොදාගෙන නොතිබුණි. එමෙන්ම 2012 වර්ෂයේදී රු.6,202,329 ක් වැයකර මිලට ගන්නා ලද කර්බ් (Cuber) යන්ත්‍රය 2014 නොවැම්බර් මාසය වන විටත් එකලස් කිරීමක් හෝ සිදු නොකොට දිවුලපිටිය කොන්ක්‍රීට් අංගනයේ ගබඩා කර තිබුණි. එසේ වුවත් මෙම යන්ත්‍ර රක්ෂණය කිරීම සඳහා අධිකාරිය විසින් වාර්ෂිකව රු.750,915 ක් බැගින් වැයකර තිබුණි.

(උ) අධිකාරිය විසින් ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණ අතර අවුරුදු 05 සිට 10 දක්වා නිලධාරීන් 133 ක්ද, අවුරුදු 11 සිට 15 දක්වා නිලධාරීන් 52 ක්ද, අවුරුදු 16 සිට 20 දක්වා නිලධාරීන් 16 ක්ද, අවුරුදු 20 හෝ ඊට වැඩි කාලයක් නිලධාරීන් තිදෙනෙකුද එකම සේවා ස්ථානයේ හා එකම විෂයෙහි සේවයේ නියුක්ත කර තිබුණි.

## 5.7 තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය

2010 අගෝස්තු සිට 2014 ජූලි දක්වා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා හිඟ දායක මුදල් වශයෙන් රු.654,617 ක් හා අධිභාර වශයෙන් රු.277,472 ක් ආයතනය විසින් 2014 වර්ෂයේදී ගෙවා තිබුණි. හිඟ දායක මුදලට ඇතුලත් වූ රු.261,846 ක සේවක දායක මුදල සේවකයන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 5.8 මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 වර්ෂයේදී ඇතිකරගත් එකඟතාවයක් මත කඩවත බස් නැවතුම්පළ ඉදිකර තිබූ නමුත් එම ඉඩම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධිකාරියට පවරාගෙන නොතිබුණි.

(ආ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දක්වා ඇති ඉන්ධන සීමාවන් ඉක්මවා අධිකාරියේ නිලධාරීන් තිදෙනෙකු විසින් 2014 වර්ෂයේදී ඉන්ධන ලීටර් 2,249 ක් භාවිතා කර තිබුණි.

(ඇ) අධිකාරිය විසින් බදුදී තිබූ බස්නැවතුම්පළ 04 ක ඇති කඩ කාමර 44 කින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.6,384,672 ක හිඟ කඩ කුලියක් අයකර ගතයුතුව තිබුණි.

## 6. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්ය සාධනය

#### 6.1.1 රජයේ ප්‍රදාන

සමාලෝචිත වර්ෂයට අදාලව පළාතේ සංවර්ධන කාර්යයන් සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන හා ඒවා උපයෝජනය පහත පරිදි විය.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැය කළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| (i) | පළාත් නිශ්චිත කාර්ය ප්‍රදාන | 1,338.26 | 1,195.95 | 142.31 |
| (ii) | පළාත් සංවර්ධන ප්‍රදාන | 1,637.77 | 1,399.98 | 237.79 |
| (iii) | උපමාන පාදක ප්‍රා.ලේ. කොට්ඨාශ වැඩසටහන | 499.38 | 458.40 | 40.98 |
| (iv) | විශේෂ අංශ සංවර්ධන ප්‍රදාන - සෞඛ්‍ය | 375.88 | 332.51 | 43.37 |
| (v) | විශේෂ අංශ සංවර්ධන ප්‍රදාන - අධ්‍යාපන | 286.05 | 234.02 | 52.03 |
| | එකතුව | 4,137.34 | 3,620.86 | 516.48 |

#### 6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාවූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු.මිලියන 4,323.60 ක ඇස්තමේන්තු අගයකට වූ යෝජනා 7,968 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ඒවායේ ප්‍රගතිය පහත පරිදි විය.

| විස්තරය | නව වැඩ | අච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. මිලියන |
| (i) සම්පූර්ණයෙන් නිම කළ | 7,129 | 195 | 7,324 | 4,010.49 |
| (ii) 50% කට වඩා අඩුවෙන් නිම කළ | 130 | - | 130 | 79.48 |
| (iii) 50% කට වඩා වැඩියෙන් නිම කළ | 36 | - | 36 | 64.83 |
| (iv) ආරම්භකර නොතිබූ | 434 | 16 | 450 | 161.40 |
| (v) මතභේදයට තුඩුදෙන / ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 28 | - | 28 | 7.40 |
| එකතුව | 7,757 | 211 | 7,968 | 4,323.60 |

## 6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 සැප්තැම්බර් 09 වනවිට විදේශ නිවාඩු කාලය අවසන් වී තිබූ ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස් බල හා රැකී රක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ සේවය කළ නිලධාරිනියක සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සේවයට වාර්තා කර නොතිබුණි. 2016 මාර්තු 09 දිනැති අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය අනුව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අත්සන් කර ඇති ගිවිසුම අනුව රජයට අයවිය යුතු රු.981,800 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දක්වා තිබූ නමුත් 2016 මැයි මාසය දක්වාත් එකී මුදල අය කරගෙන නොතිබුණි.

(ආ) අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශයේ රු.1,500,000 ක ප්‍රතිපාදන මත ශිල්පීන් 75 දෙනෙකු පුහුණු කිරීම සඳහා නාට්‍ය වැඩමුළුවක් සැලසුම් කර තිබුණි. එහෙත් ඒ සඳහා සහභාගීවී තිබුණේ ශිල්පීන් 38 දෙනෙකු පමණක්වූ අතර නාට්‍ය වැඩමුළුවට සහභාගී නොවූ පුද්ගලයන් 06 දෙනෙකු සඳහාද රු.150,000 ක ත්‍යාග මුදල් ලබාදී තිබුණි. තවද බස්නාහිර පළාත් 2015 ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහී ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1,128 දෙනෙකුට මුදල් ත්‍යාග ලබාදීම සඳහා 2015 නොවැම්බර් මාසයේදී අමාත්‍යාංශය විසින් රු.810,250 ක් වැයකර තිබුණි. එහෙත් 2016 පෙබරවාරි මාසයේ විගණන පරීක්ෂණ අවස්ථාව වනවිටත් මුදල් ත්‍යාග ලබාදී තිබුණේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 487 දෙනෙකු සඳහා රු.398,750 ක් පමණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය හා මීනුවන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලවලට අදාලව පළාත් සභා පාසල්, ගුරු මධ්‍යස්ථාන, පරිගණක මධ්‍යස්ථාන, සංවර්ධන මධ්‍යස්ථාන, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ඇතුළු ආයතන 283 ක් පැවතියද සමාලෝචිත වර්ෂයට අදාල සමීක්ෂණ කටයුතු අවසන් කර තිබුණේ ආයතන 87 ක පමණි.

(ඈ) ආයතන 03 ක් විසින් 2014 වර්ෂයේදී ව්‍යාපෘති සඳහා මිලදීගෙන තිබූ භාණ්ඩ වර්ග 19 ක රු.525,225 ක් වටිනාකමැති ඒකක 647 ක් 2016 මාර්තු මාසය දක්වාත් බෙදාහැර නොතිබුණි.

(ඉ) කැළණිය කලාප අධ්‍යාපන කාර්යාලයේ හිඟ වැටුප් ගණනය කළයුතු ගුරුභවතුන් සංඛ්‍යාව 3,856 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ගුරුභවතුන් 2,664 දෙනෙකුගේ හිඟ වැටුප් ගණනය කර නොතිබුණි.

(ඊ) අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යවරයා 2015 ජුනි මස සහභාගීවී තිබූ විදේශ සංචාරය සඳහා සංයුක්ත දීමනා වශයෙන් රු.228,986 ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම මුදල ආපසු අයකරගත යුතු බව

අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2015 අගෝස්තු 03 දිනැති ලිපියෙන් දක්වා තිබුණද 2016 ජුනි මාසය දක්වාත් එකී මුදල් අයකරගෙන නොතිබුණි.

(උ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය පුද්ගලයන් 25 දෙනෙකු සඳහා නේවාසික පහසුකම්වලින් සමන්විත වුවද 2014 හා 2015 වර්ෂවලදී කිසිදු නේවාසික වැඩමුළුවක් පවත්වා නොතිබුණි.

(ඌ) මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට වාහනයක් මිලදීගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් 2011 වර්ෂයේදී ලැබී තිබූ රු.1,009,233 ක මුදල තැන්පතු යටතේ පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වාහනයක් මිලදීගැනීම සිදුව නොතිබුණි.

## 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ඔක්තෝබර් මාසයේදී ගබඩාවට ලැබුණු 2015 ඔක්තෝබර් මාසයේ කල්ඉකුත්වීමට නියමිත Promathasing පෙති 1000 ක තොගයක් මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ගබඩාවේ තිබුණද නැවතත් 2015 ජනවාරි 30 දින තවත් පෙති 500 ක තොගයක් ලබාගෙන තිබුණි. තවද 2015 මාර්තු මාසයේදී කල් ඉකුත්වූ DPT එන්නත් මාත්‍රා 259 ක් ගබඩාවේ පැවතුණි.

(ආ) මීරිගම මූලික රෝහලේ සැත්කම් සිදුකිරීමේදී පමණක් අවශ්‍ය වන ඔක්සිජන් සිලින්ඩර් 16 ක් තිබුණද මෙම රෝහලේ සැත්කම් සිදුනොකරනු ලබන බැවින් එකී උපකරණ දිගුකලක සිට අභාවිතව පැවතුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල විසින් හෘද රෝගීන් සඳහා අත්‍යාවශ්‍ය ඖෂධයක් වන Enoxaparin 12,000 ක ප්‍රමාණයක් 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර තිබුණද පළමු මාස 03 සඳහාම ලැබී තිබුණේ 1,450 ක තොගයක් පමණි. රෝහලේ අවශ්‍යතාවය සඳහා එකී ඖෂධ ප්‍රමාණවත් නොවීම නිසා එකක් රු.1,656.50 බැගින් එන්නත් 317 ක් බාහිරින් මිලදීගැනීම සඳහා රු.525,110 ක් වැයකර තිබුණි. එසේම රෝහල විසින් 2014 වර්ෂයේ ඩෙංගු රෝගීන් සඳහා සැපයීමට ලබාගෙන තිබූ රු.1,211,016 ක් වටිනාකමැති Dextran 40% නැමති ඖෂධයේ බෝතල් 695 ක් 2014 පෙබරවාරි මාසයේ සිටම භාවිතයට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත දින 100 පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන යටතේ රු.13,000,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර ඉන් රු.3,487,735 ක් අරමුණුගත කාර්යයන්ගෙන් පරිබාහිර කාර්යයන් සඳහා වැයකර තිබුණි. මීට අමතරව බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ලැබුණ රු.7,750,000 ක්වූ ප්‍රතිපාදනවලින් රු.857,029 ක් ව්‍යාපෘති අරමුණුවලින් පරිබාහිර කාර්යයන් සඳහා වැයකර තිබුණි.

(ආ) ලෝක බැංකු ණය ආධාර යටතේ පානදුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු රු.102,662,558 ක්වූ ප්‍රතිපාදනවලින් අරමුණුගත කාර්යන්ගෙන් පරිබාහිර කාර්යයන් සඳහා අවස්ථා 05 කදී රු.3,933,044 ක් වැයකර තිබුණි.

(ඇ) හෝමාගම දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්තව සිටි රියදුරෙකු 2015 ජූලි මාසයේ සිට කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් රු.408,940 ක් ගෙවා තිබුණි.

(ඈ) රජයේ මුද්‍රණාලය හා පළාත් සභාව සතුව මුද්‍රණාලයක් තිබියදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු.3,645,000 ක් වැයකර වාහන ආදායම් බලපත්‍ර 1,500,000 ක් පෞද්ගලික ආයතනයකින් මුද්‍රණය කරවාගෙන තිබුණි.

(ඉ) වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2007 ජුනි මාසයේ සිට ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ ආපන ශාලාව මාසිකව රු.50,000 ක කුලියකට එකම කොන්ත්‍රාත්කරුවෙකුට ලබාදී තිබුණි. එමෙන්ම ආපන ශාලාවේ ජල සැපයුම වෙනුවෙන්ද රෝහලට අදාල බිල්පතෙන් ගෙවීම් සිදුවන බව විගණනයේදී අනාවරණය විය.

## 6.5 දුශ්‍ය අක්‍රමිකතා

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පළාත් සභාවට අයත් අක්කර 11 පර්චස් 26 ක් වන ගල්ලෙනයාලන්ද නැමති ඉඩමේ බදුකරු විසින් ව්‍යාජ ඔප්පු සකස් කර එකී ඉඩම පුද්ගලයන් 20 දෙනෙකුට විකුණා තිබුණි.

(ආ) පෞද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව විසින් 2011 හා 2012 වර්ෂවලදී පෞද්ගලික වෛද්‍ය සේවා ගාස්තු ලෙස පළාත් සභාවට හිමි ආදායම් වෙනුවෙන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ලබාදී තිබූ රු.1,692,800 ක් වටිනා චෙක්පත් 04 ක් පළාත් සභා ආදායමට ගෙන නොතිබුණි. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් මෙම චෙක්පත් කුමන කරුණක් සඳහා යොදවා ඇත්ද යන්න පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 6.6 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මීගමුව අධ්‍යාපන කලාපයේ ගුණාත්මක යෙදවුම් මුදල් භාවිතා නොකළ පාසල් 36 ක් තිබූ අතර එයින් පාසල් 14 ක් සඳහා ලැබී තිබූ රු.3,232,138 කින් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ විගණන අවස්ථාව වනවිටත් වැය කර තිබුණේ රු.28,778 ක් පමණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යලයට අයත් දොම්පෙ රෝහලේ නව රසායනාගාරය ඉදිකිරීම සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් රු.760,998 ක් ලැබී තිබූ නමුත් අදාල ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ආරම්භ කර නොතිබුණි.

## 6.7 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ධීවර, මාර්ග ,ප්‍රවාහන, සමූපාකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2010 සිට 2014 කාලය තුළ රු.29,918,786 ක වියදමක් දරා තිබූ පිටිපන ජල ජීවී වගා මධ්‍යස්ථානය වර්තමානයේ අක්‍රීය තත්ත්වයක පවතින බව 2015 ඔක්තෝබර් 19 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එහිදී රු.6,003,961 ක වියදමක් දරා ඉදිකර තිබූ මත්ස්‍ය අභිජනන ටැංකි 68 ක් හා රු.1,324,291 ක් වැයකර ලබාගෙන තිබූ රසායනාගාර උපකරණද ප්‍රයෝජනයට නොගැනීම නිසා විනාශ වෙමින් පවතින බව හඳුනාගත හැකි විය. එමෙන්ම

මෙම පරිශ්‍රය පිහිටා තිබූ භූමියෙන් පර්චස් 35 ක පමණ කොටසක අනවසර කරවල වාඩියක් පවත්වාගෙන යන බවත් එහි අපද්‍රව්‍ය ආසන්න කලපුවට මුදාහැරීම හේතුවෙන් ජලය අපවිත්‍රවීම නිසා ඉදිකර තිබූ මත්ස්‍ය අභිජනන ටැංකිවලට අවශ්‍ය පිරිසිදු ජලය ලබාගැනීම දුෂ්කරවී ඇති බවත් වැඩිදුරටත් අනාවරණය විය.

(ආ) ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යලය මඟින් පාලනය වන නිල නිවාස 96 න් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ප්‍රයෝජනයට ගෙන තිබුණේ නිල නිවාස 60 ක් පමණි.

## 6.8 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් 2015 ජූලි මාසයේ සිට බදු පදනමට ලබාගෙන තිබූ අතර එයින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට වෙන්කළ කොටස සඳහා එදින සිට මාසිකව රු.242,000 ක කුලියක් ප්‍රධාන ලේකම් වැය ශීර්ෂය යටතේ ගෙවා තිබුණි. එසේ නමුත් 2016 අප්‍රේල් මාසයේ විගණන අවස්ථාව වනවිටත් අධිකාරිය මෙම ගොඩනැගිල්ලේ ස්ථාපිත කර නොතිබූ බව අනාවරණය විය.

## 6.9 හඳුනාගන්නා ලද පාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යලයේ වාහනවලට අදාලව 1995 සිට 2002 දක්වා කාලය තුළ සිදුවූ අනතුරු වෙනුවෙන් රක්ෂණ වන්දි ඉල්ලීම 2012 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් රක්ෂණ සංස්ථාවෙන් වන්දි අයකර ගත නොහැකිවී තිබුණි. මේනිසා රු.188,888 ක්වූ අලාභයක් පොතෙන් කපාහැරීමට කටයුතු කරමින් පැවතුණු අතර ඉන් රු.160,328 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට කපාහැර තිබුණි.

(ආ) 2005 මාර්තු 07 දින අනතුරට පත්වූ මීගමුව දිස්ත්‍රික් මහ රෝහලට අයත් අංක HN - 7484 දරන ගිලන් රථය සම්බන්ධයෙන් රක්ෂණ ආවරණ ලබාගැනීම සඳහා ලිපි ලේඛන කාලානුරූපීව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.217,275 ක් අලාභය පොතෙන් කපාහැරීමට සිදුවී තිබුණි.

## 6.10 ප්‍රමාදවූ ව්‍යාපෘති

-----------------

දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ක්ලයිඩ් වත්ත ගල්කැටිය නැමති ඉඩමේ පස් කැපීමට හා ඉන් අනතුරුව ඉඩම නිවාස ඉදිකිරීම සඳහා සුදුසු තත්ත්වයට පත්කිරීමට පෞද්ගලික සමාගමක් විසින් 2006 වර්ෂයේදී භාරගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල ඉඩම නිවාස ඉදිකිරීමට සුදුසු තත්ත්වයට පත්කර නොතිබූ අතර කැපූ පස් සඳහා වූ රු.584,000 ක රාජ්‍ය භාගයද ගෙවා නොතිබුණි.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.11.1 පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා නිරීක්ෂණයන් පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව ස්ථිර | තථ්‍ය සේවක සංඛ්‍යාව අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 826 | 745 | 22 | 81 | - |
| තෘතීය | 435 | 312 | - | 123 | - |
| ද්විතීය | 4,440 | 3,664 | 135 | 776 | - |
| ප්‍රාථමික | 3,823 | 3,914 | 05 | - | 91 |
| කොන්ත්‍රාත් | 13 | - | - | 13 | - |
| තාවකාලික/අනියම්/ආදේශක | 14 | - | 09 | 05 | - |
| එකතුව | 9,551 | 8,635 | 171 | 998 | 91 |

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 41 දෙනෙකු වූ අතර 2016 ජනවාරි මාසය වනවිට කාර්ය මණ්ඩලය 36 ක් විය. මින් දෙදෙනෙකු වෙනත් කාර්යාලවලට අනුයුක්තව සිටි අතර එක් නිලධාරිනියක් වෙනත් ආයතනයකින් මෙම කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් තිබුණි.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුමත ඉංජිනේරු තනතුරු සංඛ්‍යාව හතරක් වූ අතර ඉන් තුනක් පුරප්පාඩුවී තිබුණි. එයින් කළුතර සහ ගම්පහ දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල ඉංජිනේරු තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (විශේෂ ශ්‍රේණියේ) නිලධාරීන් තිදෙනෙකු 2013 හා 2014 වර්ෂවල සිට වෙනත් ආයතන වෙත අනුයුක්ත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් එම නිලධාරීන් තිදෙනාට වැටුප් වශයෙන් රු.2,073,744 ක් ගෙවා තිබුණි.

### 6.11.2 පාසැල් කාර්ය මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා නිරීක්ෂණයන් පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,732 | 1,280 | 452 | - |
| ගුරුභවතුන් | 34,374 | 34,652 | - | 278 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 1,586 | 1,215 | 371 | - |
| එකතුව | 37,692 | 37,147 | 823 | 278 |

(අ) කොළඹ අධ්‍යාපන කලාපයේ කාන්තා විද්‍යාලයක ගුරුතුමියකගේ විදේශ නිවාඩු කාලය 2013 ජූලි 10 අවසන්වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නැවත සේවයට වාර්තා කර නොතිබුණි. මෙම ගුරුතුමිය හැදෑරූ පුහුණු පාඨමාලාව වෙනුවෙන් ඇති කරගෙන තිබූ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අයකර ගතයුතු වියදම රු.500,000 ක් විය.

(ආ) කොළඹ අධ්‍යාපන කලාපයට අයත් ආනන්ද විද්‍යාලයේ ගුරුතුමියකගේ විදේශ නිවාඩු කාලය 2014 නොවැම්බර් 25 අවසන්වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නැවත සේවයට වාර්තා කර නොතිබුණි.

(ඇ) කැළණිය, මිනුවන්ගොඩ, මීගමුව හා ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලවල සේවය ස්ථිර කිරීමේ කාලසීමාව සම්පූර්ණ කර ඇති ගුරුභවතුන් 173 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ස්ථිර කර නොතිබුණි. ප්‍රතිඵල සනාථ නොවීම, විදුහල්පති වාර්තා ඉදිරිපත් නොවීම, වැඩභාර ගැනීමට අදාල ලොග් සටහන් ලැබී නොතිබීම වැනි හේතු මීට බලපා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසල් 131 ක විෂයන් 19 ක් සඳහා සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු 146 ක් හා නියෝජ්‍ය විදුහල්පති තනතුරු 23 කද සහකාර විදුහල්පති තනතුරු 42 කද පුරප්පාඩු පැවතුණි.

**6.11.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා නිරීක්ෂණය පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| වෛද්‍ය | 2,049 | 1,973 | - | 76 |
| හෙද හෙදි | 3,268 | 3,002 | 11 | 266 |
| සහාය කාර්ය මණ්ඩලය | 4,288 | 3,063 | 49 | 1,225 |
| සුළු සේවක | 3,515 | 3,375 | - | 140 |
| එකතුව | 13,120 | 11,413 | 60 | 1,707 |

පානදුර රෝහලේ කාර්ය මණ්ඩලයේ තනතුරු 28 කට අදාලව පුරප්පාඩු 82 ක් පැවති බවත් 2006 වර්ෂයෙන් පසු රෝහල් කාර්යය මණ්ඩලය සංශෝධනය කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**6.11.4 පළාත් පාලන ආයතන**

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ | 535 | 375 | 38 | 160 |
| තෘතීය | 345 | 216 | - | 129 |

| | | | | |
|---|---|---|---|---|
| ද්විතීය | 6,134 | 4,573 | 52 | 1,561 |
| ප්‍රාථමික | 14,446 | 12,636 | 531 | 1,810 |
| කොන්ත්‍රාත් | 15 | - | 09 | 06 |
| තාවකාලික/අනියම්/ආදේශක | 20 | - | 14 | 06 |
| එකතුව | 21,495 | 17,800 | 644 | 3,672 |

### 6.11.5 ප්‍රඥප්ති මඟින් පිහිටවූ ආයතන

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ | 77 | 48 | 08 | 29 |
| තෘතීය | 99 | 78 | 05 | 21 |
| ද්විතීය | 495 | 439 | 02 | 56 |
| ප්‍රාථමික | 643 | 613 | - | 30 |
| එකතුව | 1,314 | 1,178 | 15 | 136 |

### 6.12 වාහන උපයෝජනය

ධීවර, මාර්ග ,ප්‍රවාහන, සමූපාකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යවරයා වෙත වෙන්කර තිබූ අංක KC-8010 දරන ජීප් රථය 2014 අප්‍රේල් 24 දින අක්‍රිය තත්ත්වයෙන් අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරුගේ වාර්තාව අනුව රේඩියේටරයේ ජල කාන්දුවක් පැවතියදී ධාවනය කිරීම හේතුවෙන් එන්ජිම අක්‍රියවී ඇති බව දක්වා පාවිච්චි කරන ලද එංජිමක් සවිකිරීම සඳහා රු.878,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍යාංශය විසින් එකී ඇස්තමේන්තුව මත රු.812,291 ක වියදමක් දරා වාහනය අළුත්වැඩියා කරවාගෙන තිබුණි. මෙයට වගකිවයුතු අය පිළිබඳ සිදුකළ පරීක්ෂණය, ඉවත්කළ එංජිම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය හා නව එංජිමක් සවිකිරීම හේතුවෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගෙන් ලබාගත් අනුමැතිය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

### 6.13 බැංකු සැසඳුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමූපකාර තිරක අරමුදලේ බැංකු ජංගම ගිණුමක උපලබ්ධි නොවූ තැන්පතු රු.10,000 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන 06 ක බැංකු ජංගම ගිණුම් 06 කට අදාලව ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු.408,479 ක්වූ චෙක්පත් 61 ක් විය.

(ඇ) ආයතන 08 ක බැංකු ජංගම ගිණුම් 08 කට අදාලව හඳුනා නොගත් හර රු.2,164,515 ක් හා ආයතන 06 ක බැංකු ජංගම ගිණුම් 06 කට අදාලව හඳුනා නොගත් බැර රු.134,262 ක් විය.

(ඈ) ලියන ලද චෙක්පත් අප්‍රමාදව අදාල පාර්ශවකරුවන් වෙත භාරදිය යුතු වුවත් කොළඹ කලාප අධ්‍යාපන කාර්යලය විසින් 2015 දෙසැම්බර් මස ලියන ලද රු.7,111,699 ක් වටිනා චෙක්පත් 147 ක් හා ගුරුවරුන්ගේ හිඟ වැටුප් සඳහා 2015 දෙසැම්බර් මස ලියන ලද රු.1,412,527 ක්

වටිනා චෙක්පත් 06 ක් 2016 පෙබරවාරි මාසයේ විගණන අවස්ථාව වනවිටත් අදාල පාර්ශවයන් වෙත භාරදී නොතිබුණි.

(ඉ) අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් මස ලියන ලද රු.41,579,614 ක් වටිනා චෙක්පත් 283 ක් 2016 පෙබරවාරි මස විගණන අවස්ථාව දක්වාත් අදාල පාර්ශවයන් වෙත භාරදී නොතිබුණි.

## 6.14 පළාත් පාලන බලමණ්ඩල කටයුතු අධීක්ෂණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබුණි. තවද, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාවනය කර ඇති හා අහිතකර මතයක් ප්‍රකාශ කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය ඇතුළුව ආසන්න වසර 05ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාවනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | අහිතකර මතයක් ප්‍රකාශකළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|---|
| 2011 | 48 | 20 | - |
| 2012 | 48 | 26 | - |
| 2013 | 48 | 04 | 25 |
| 2014 | 48 | 01 | 02 |
| 2015 | 26 | - | 01 |

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබු තොරතුරු අනුව බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 48 හි හිඟ ආදායම රු.4,889,734,583 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 13 ක නිලධාරීන්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 57 කට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ අධිභාර වල අගය රු.36,252,371 ක් විය.

(ඈ) පළාත් පාලන බලමණ්ඩලවල පවත්නා අඩුපාඩු පිළිබඳව 2016 මැයි 30 දක්වා පළාත් පාලන ආයතන 22 කට නිකුත් කර තිබූ විගණන විමසුම් 155 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 7.1 අයවැය ලේඛනමය පාලනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අදාල විචලනයන් සමඟ පහත පරිදි විය.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| **ආදායම්** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| **බදු ආදායම්** | 33,130,020 | 31,540,490 | 1,589,530 | 28,284,973 | 28,112,653 | 172,320 |
| **බදු නොවන ආදායම්** | 2,760,154 | 3,268,552 | (508,398) | 2,992,291 | 2,979,182 | 13,109 |
| **රජයේ ප්‍රදාන** | 20,999,680 | 21,754,758 | (755,078) | 14,526,099 | 13,306,497 | 1,219,602 |
| **එකතුව** | **56,889,854** | **56,563,800** | **326,054** | **45,803,363** | **44,398,332** | **1,405,031** |
| **වියදම්** | | | | | | |
| **පෞද්ගලික පඩිනඩි** | 32,841,078 | 32,301,077 | 540,001 | 25,341,691 | 25,119,407 | 222,284 |
| **අනෙකුත් පුනරාවර්තන** | 17,563,836 | 17,132,714 | 431,122 | 13,682,034 | 13,462,641 | 219,394 |
| **පළාත් ආයෝජන ප්‍රාග්ධන** | 6,484,940 | 5,283,724 | 1,201,217 | 6,779,637 | 5,863,476 | 916,161 |
| **එකතුව** | **56,889,854** | **54,717,515** | **2,172,340** | **45,803,362** | **44,445,524** | **1,357,839** |

### 7.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාවට ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2010 | 2012 ජනවාරි 16 | 2012 මැයි 22 |
| 2011 | 2013 පෙබරවාරි 28 | 2013 දෙසැම්බර් 03 |
| 2012 | 2014 අගෝස්තු 27 | 2015 ජනවාරි 20 |
| 2013 | 2014 දෙසැම්බර් 31 | 2015 ජුනි 13 |
| 2014 | 2015 සැප්තැම්බර් 18 | 2016 මැයි 03 |

### 7.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය හා මීගමුව අධ්‍යාපන කලාපවල පරීක්ෂාවට ලක්කළ පාසල් 232 න් පාසල් 13 ක වැසිකිළි හෝ කැසිකිළි පහසුකම් නොමැති බව අනාවරණය විය.

**8.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | ක්ෂේත්‍රය<br>--------- | අඩුපාඩුව<br>---------- |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | • නිරවුල් නොකළ අග්‍රිම, ප්‍රේෂණ හා තැන්පතු පැවතීම.<br>• ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය. |
| (ආ) | ආදායම් කළමනාකරණය | • පළාත් ඉඩම් කොමසාරිස්, පළාත් ආදායම් කොමසාරිස් හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල හිඟ ආදායම් හා ආදායම් එකතු කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ඇ) | පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය | • හිඟ ආදායම් හා අය නොවන අධිභාර පැවතීම. |
| (ඈ) | සේවක මණ්ඩල | • අධ්‍යාපන හා සෞඛ්‍ය කාර්යය මණ්ඩලවල පුරප්පාඩු පැවතීම. |